# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2346/14 - 2023 අගෝස්තු මස 21 වැනි සඳුදා - 2023.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BD/UP/LND.1/UMAYA/THALPI/02-1.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/9/2014/IR/58.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්පහ කෝරළයේ, සුළු කොට්ඨාසයේ, වැතලාව ග්‍රාම නිලධාරි වසමෙහි, ගලනිහේගම ගමෙහි අවසාන ගම් සිතියම් අංක 392 හි අතිරේක අංක 01 හි පත්‍ර 02 දරන ඉඩම් කැබලි 02ක් සඳහා පිළියෙල කරන ලද 2023.05.30 දිනැති සර්වේයර් ජනරාල්ගේ අංක B/UVP/2021/284 දරන මූලික පිඹුරේ දක්වා ඇති හෙක්ටයාර් 0.9096 වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුතු ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අංක 175**

ඉඩමේ නම : මීගහයාය; විස්තරය : කුඹුර; හිමිකම් කියන අය : මස්පන්න, ගලනිහ පදිංචි කැලණිය බණ්ඩාරලාගේ පොඩිමහත්තයා මයා; ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.1191.

**02. කැබලි අංක 222**

ඉඩමේ නම : වේවැල්තලාවයාය; විස්තරය : කැළෑව; හිමිකම් කියන අය : මස්පන්න, ගලනිහ පදිංචි කැලණිය බණ්ඩාරලාගේ ඉන්ද්‍රපාල මයා; ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.7905.

ඉහත සඳහන් කැබලි අංක 175 හා 222 ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම එකී හිමිකම්, අයිතිවාසිකම් හෝ සම්බන්ධකම් ඉදිරිපත් කිරීම පිණිස තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ඔක්තෝබර් මස 25 වැනි දින පෙ.ව. 09.30 ට ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2023 ඔක්තෝබර් මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්. ජී. එම්. එස්. කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
ඌවපරණගම.

2023 අගෝස්තු මස 16 වැනි දින,
ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0229

1A - G 040180 – 09 (2023/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*